1998 දෙසැම්බර 09 වන දින මහා මණ්ඩල තීරණ 53/144

# සකල ලෝකවාසීන්ම පොදුවේ පිළිගත්

# මානව අයිතිවාසිකම් සහ සියළු මිනිස් මූලික නිදහස

# වර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වු

# තනි පුද්ගලයන්ගේ, පුද්ගල කණ්ඩායම්වල සහ සමාජ සංවිධානවල

# අයිතිවාසිකම් සහ වගකීම් පිළිබද ප්‍රකාශනය

## මානව හිමිකම් සුරකින්නන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය

සිංහල
Sinhala

සිංහල / Sinhala

First translated and printed by

Law & Society Trust (LST)

rightsnow
Collective for Democracy

Printed by

FORUM-ASIA

# සකල ලෝකවාසීන්ම පොදුවේ පිළිගත්

# මානව අයිතිවාසිකම් සහ සියළු මිනිස් මූලික නිදහස

# වර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වූ

# තනි පුද්ගලයන්ගේ, පුද්ගල කණ්ඩායම්වල සහ සමාජ සංවිධානවල

# අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ ප්‍රකාශනය

## මානව හිමිකම් සුරකින්නන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය

සිංහල / Sinhala

Cover/ Layout:
Sverre Rakkenes

First translated and printed by:
Law & Society Trust (LST)
3 Kynsey Terrace
Colombo 8
Sri Lanka

www.lawandsocietytrust.org

&

Rights Now Collective for Democracy
24/13, Wijayaba mawatha
Nawala Road
Nugegoda
Sri Lanka

Copyright © 2008
This book was written for the benefit of human rights defenders and may be quoted from or copied so long as the source and authors are acknowledged

Printed by:
Asian Forum for Human Rights and Development
(FORUM-ASIA)
12th Floor, Room 12-01, Times Square Building
Sukhumvit Road, Between Soi 12-14,
Khlong Toei, Khlong Toei
Bangkok, 10110 Thailand

www.forum-asia.org

# සකල ලෝකවාසීන්ම පොදුවේ පිළිගත් මානව අයිතිවාසිකම් සහ සියළු මිනිස් මූලික නිදහස වර්ධනය කිරීම සහ ආරක්‍ෂා කිරීම සඳහා වු තනි පුද්ගලයන්ගේ, පුද්ගල කණ්ඩායම්වල සහ සමාජ සංවිධානවල අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ ප්‍රකාශනය

පූර්විකාව

ලෝකයේ සියලු රටවල ජීවත්වන ජනතාවගේ මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස වර්ධනය කිරීමත්, ආරක්‍ෂා කිරීමත් සඳහා සම්මත කරගෙන තිබෙන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි සඳහන් අරමුණු සහ මුලධර්ම පිළිපැදීමෙහි වැදගත්කම නැවත වරක් තහවුරු වී ඇත.

මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස පිළිපැදීමටත්, ඊට ඇති පොදු පිළිගැනීම වර්ධනය කිරීමටත් ජාත්‍යන්තර වශයෙන් ගෙන ඇති මූලික පියවරයන් ලෙස සැලකෙන, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන්, එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිගෙන ඇති වෙනත් මානව හිමිකම් සම්මුතීන් සහ කලාපීය වශයෙන් පිළිගෙන ඇති මානව හිමිකම් සම්මුතීන් යන සම්මුතිවල වැදගත්කම ද නැවත තහවුරු වී ඇත.

සියළුමදෙනාගේ මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස වර්ධනය කිරීමත්, ඊට ගෞරවය දක්වීමට සියලුමදෙනා උනන්දු කරවීමත් සඳහා තනිව මෙන්ම සාමූහිකවද කටයුතු කිරීම ලෝකවාසී ජනතාවගේ දැඩි වගකීමක් වන බව අවශ්‍යයෙන්ම පිළිගත යුතුව ඇත. එම වගකීම ඉටුකිරීමෙහි දී අන්තර්ජාතික වශයෙන් සහයෝගය ලබාගැනීම විශේෂ වැදගත්කමකින් යුතු කාර්‍යයක් වේ. එසේම මෙම වගකීම ඉටු කිරීමෙහි දී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි සඳහන් කර ඇති පරිදි ජාතිය, වර්ණය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මත, ජාතික හෝ සමාජ සම්භවය, දේපල සහ උපත යන කරුණු මත පදනම්ව හෝ වෙනත් ඕනෑම ආකාරයකින් සිදුකෙරෙන

සියලු වෙනස්කම් ප්‍රතික්ෂේප කළ යුතුය.

තමන් සතු ධනය සහ ස්වාභාවික සම්පත් කෙරෙහි තමන්ගේ පූර්ණ පාලන බලතල ක්‍රියාත්මක කිරීමට ජනතාවට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීම, එකට ජීවත් වෙමින් එකට පාලනය වීම සඳහා ජනතාවට ඇති අයිතිය (ස්වයංනිර්ණ අයිතිය) ප්‍රතික්ෂේප කිරීම, වර්ණභේදවාදය, ජාතිය මත පදනම් වන වෙනස්කම්වලට බඳුන්කිරීම, යටත්විජිතවාදය, විදේශ ආධිපත්‍යය පැතිරවීම හෝ යටත්කර ගැනීම, ප්‍රචණ්ඩකාරීත්වය, ජාතික ස්වාධිපත්‍යයට හෝ ජාතික ඒකාග්‍රතාවයට හෝ භෞමික අඛණ්ඩතාවයට තර්ජනයක් වීම මගින් අයිතිවාසිකම් උල්ලංඝනයවීම් ආදිය පුළුල්, බරපතල හෝ ක්‍රමානුකූල ආකාරයෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ලෙස හඳුනාගෙන ඇත.

ඒ අනුව මානව අයිතිවාසිකම් සහ මූලික නිදහසට බලපාන සියලුම ආකාරයේ අයිතිවාසිකම් උල්ලංඝනයවීම් ඵලදායී ලෙස තුරන් කරලීමට ජාත්‍යන්තර සහයෝගීතාවය තුලින් වැදගත් වැඩ කටයුතු රැසක් ඉටු කළයුතුව ඇත. එමෙන්ම එම උල්ලංඝනයවීම් තුරන්කරලීමට තනි පුද්ගලයන්ගේ, පුද්ගල කණ්ඩායම්වල සහ සමාජ සංවිධාන මගින් ලබාදෙන විශාල දායකත්වය ද අතිශය වැදගත් වනු ඇත.

ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාවත්, මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස භුක්තිවිදීමත් යන කරුණු දෙක අතර ඇත්තේ අඛණ්ඩ සබඳතාවයකි. ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව නොමැතිවීම එකඟතාවයන් ඇති නොවීමට සමාවක් නොවන බව ඒ සමඟම මතකයේ තබාගත යුතුය.

මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස වනාහී සියලු ලෝක වාසීන්ට ම පොදු මෙන්ම නොබෙදිය හැකි එකක් ද වේ. එසේම ඒවා එකිනෙක මත රඳා පවතින සහ එකිනෙකට සම්බන්ධ ඒවා ද වේ. තවද, සෑම අයිතිවාසිකමක් සහ නිදහසක් ම ක්‍රියාත්මක කිරීමේදී කිසිඳු අගතියකට පත්නොවන පරිදි ඒවා වර්ධනය කිරීමත්, පැහැදිලි සහ සාධාරණ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමත් කළයුතුව ඇත.

මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස වර්ධනය කිරිමේ හා ආරක්ෂා කිරීමේ මූලික යුතුකම සහ වගකීම රජය වෙත පැවරෙයි.

ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමින් ද මානව හිමිකම් සහ මූලික නිදහස පිළිබඳව අවබෝධය වර්ධනය කිරීමත්, ඒ පිළිබඳව උනන්දුවක් ඇති කිරීමත්, තනි පුද්ගලයන්ගේ, පුද්ගල කණ්ඩායම්වල සහ සංවිධානවල අයිතිවාසිකමක් මෙන්ම වගකීමක් ද වේ.

එබැවින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මෙසේ ප්‍රකාශකර සිටී.

1 වන වගන්තිය

ජාතික මට්ටමින් සහ ජාත්‍යන්තර මට්ටමින් මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස වර්ධනය කිරීමටත්, ආරක්ෂා කිරීමට මෙන්ම අවබෝධ කරවීමටත් තනිව හෝ අන්අය ද සමඟ වෙහෙස වී කටයුතු කිරීමට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

2 වන වගන්තිය

1 වන උප වගන්තිය

සියලු මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීමත්, වර්ධනය කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් නිසි පරිදි සිදු කිරීම සියලුම රාජ්‍යයන්ට පැවරුණු මූලික යුතුකමක් සහ වගකීමක් වේ. ඒ සඳහා සමාජයීය, ආර්ථික, දේශපාලන මෙන්ම අනෙකුත් ක්ෂේත්‍රවල ද සුදුසු වටපිටාවක් නිර්මාණය කළයුතුය. එසේම තම දේශසීමාව තුළ ජීවත්වන ජනතාවට තනිවම හෝ වෙනත් අය ද සමඟ සියලුම මානව  අයිතිවාසිකම් සහ මූලික නිදහස ප්‍රායෝගිකව භුක්ති විදීමට අවශ්‍ය නීතිමය ආරක්ෂාව රජය මඟින් සලසා දිය යුතුය.

2 වන උප වගන්තිය

සෑම රජයක් විසින්ම මෙම ප්‍රකාශනය මඟින් ලබා දී ඇති අයිතිවාසිකම් සහ නිදහස හොඳින් ආරක්ෂාකිරීමට අවශ්‍ය නීතිමය, පරිපාලනමය සහ වෙනත් පියවර අවශ්‍ය පරිදි ගත යුතුය.

3 වන වගන්තිය

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ සඳහන් ප්‍රතිපාදන සමඟත්, මානව අතිවාසිකම් සහ මූලික නිදහස සම්බන්ධයෙන් රජයේ වෙනත් ජාත්‍යන්තර බැඳීම් සමඟත් අනුකූලවන දේශීය නීති රාමුවක් රජය විසින් සකසා ගත යුතුය. මෙම ප්‍රකාශනය මගින් කියවෙන මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ක්‍රියාත්මක කිරිම කළයුත්තේත්, භුක්ති විඳීම කළයුත්තේත්, ඒවා වර්ධනය කිරීම, ආරක්ෂාකිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කරගැනීම සඳහා සියලු ක්‍රියාකාරකම් මෙහෙයවිය යුත්තේත් එම දේශිය නීති රාමුව තුළ සිටිමින්ය.

## 4 වන වගන්තිය

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ සඳහන් අරමුණු සහ මූලධර්ම වලට හානි වන ලෙස හෝ ඊට පටහැනි වන ලෙස මෙම ප්‍රකාශනයෙහි සඳහන් කිසිවක් තේරුම් නොගත යුතුය. තවදුරටත් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි, මානව අයිතිවාසිකම් පිළිබද ජාත්‍යන්තර සම්මුතිවල සහ මේ ක්ෂේත්‍රයට අදාලවන වෙනත් ජාත්‍යන්තර ලේඛණවල සඳහන් ප්‍රතිපාදන සීමාකරන ලෙස හෝ ඒවායෙහි අගය අඩු කරන ලෙස මෙම ප්‍රකාශනයෙහි සඳහන් කිසිවක් තේරුම් නොගත යුතුය.

## 5 වන වගන්තිය

ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමෙන් ද මානව අයිතිවාසිකම් මෙන්ම මූලික නිදහස වර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යයෙහි දී තනිව හෝ අන් අයද සමඟ පහත සඳහන් කටයුතු කිරීමට සෑම දෙනාටම අයිතියක් ඇත.

(අ) සාමකාමීව රැස්වීමට,

(ආ) රාජ්‍ය නොවන සංවිධාන, සමිති හෝ කණ්ඩායම් ඇතිකිරීමට සහ ඒවා සමඟ සම්බන්ධවීමට හෝ එහි වැඩ කටයුතුවලට සහභාගි වීමට,

(ඇ) රාජ්‍ය නොවන හෝ රාජ්‍ය සංවිධාන සමඟ සන්නිවේදන කටයුතු කිරීමට,

## 6 වන වගන්තිය

තනිව හෝ අන් අය සමඟ පහත සඳහන් කටයුතු කිරීමට සෑම දෙනාටම අයිතියක් ඇත.

(අ) සියලු මානව අයිතිවාසිකම් මූලික නිදහස සම්බන්ධයෙන් වන තොරතුරු වලට ප්‍රවේශවීමේ, තොරතුරු දැනගැනීමේ, තොරතුරු සොයා ගැනීමේ, තොරතුරු ලබා ගැනීමේ, මෙන්ම තොරතුරු දරාගැනීමේ අයිතිවාසිකම භුක්ති විඳීමට ද අයිතියක් ඇත. මෙම අයිතිය දේශීය අණපනත්, අධිකරණය හෝ පරිපාලන පද්ධතිය මඟින් බලය ලබා දී ඇති ආකාරයට භුක්ති විඳිය යුතුය.

(ආ) මානව අයිතිවාසිකම් සහ ඊට අදාල ජාත්‍යන්තර ලේඛණ මඟින් ප්‍රතිපාදන සලසා ඇති ආකාරයට අනුව සියලු මානව අයිතිවාසිකම් මූලික නිදහස සම්බන්ධයෙන් අන්‍යයන් දරණ මතිමතාන්තර, තොරතුරු සහ දැනුම නිදහසේ ප්‍රකාශනයට පත්කිරීමට අයිතියක් ඇත. එසේම ඒවා අන්‍යයන්ට කියාදීමට හෝ පතුරුවා හැරීමට ද අයිතියක් ඇත.

(ඇ) සියලු මානව අයිතිවාසිකම් මූලික නිදහස නීතියෙන් මෙන්ම ප්‍රායෝගිකව ද පිළිපැදීමෙහි දී එය අධ්‍යයනය කිරීමට, සාකච්ඡා කිරීමට, ඒ පිළිබඳ මතිමතාන්තර ඇතිකරගැනීමට මෙන්ම ඒවා දරා ගැනීමටත් අයිතියක් ඇත. ඊට අමතරව වෙනත් සුදුසු ආකාරයන්ගෙන් මහජන අවධානය එම කරුණු කෙරෙහි යොමු කරවා ගැනීමට ද අයිතියක් ඇත.

## 7 වන වගන්තිය

තනිව හෝ අන් අය ද සමඟ නව මානව හිමිකම් සංකල්ප සහ මූලධර්ම වර්ධනය කිරීමටත්, සාකච්ඡා කිරීමටත්, ඒවා පිළිගනිමින් ඊට පක්ෂපාතීව කතා කිරීමටත් සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

8 වන වගන්තිය

1 වන උප වගන්තිය

කිසිදු වෙනස් කමකට ලක් නොවන පදනමක් මත හෝ තනිව හෝ අන් අය ද සමඟ එළදායී ලෙස තම රටේ රාජ්‍ය පාලනයට හවුල්වීම සඳහා ප්‍රවේශවීමටත්, පොදු කටයුතු මෙහෙයවීම සඳහා ප්‍රවේශවීමටත් සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

2 වන උප වගන්තිය

මහජන කටයුතු සිදු කරනු ලබන රාජ්‍ය ආයතන, නියෝජිතයන් සහ සංවිධාන වෙත ඔවුන්ගේ කාර්යයන් දියුණු කිරීම සඳහා තනිව හෝ අන් අය ද සමඟ එක්ව එම ආයතන වෙත යෝජනා ඉදිරිපත් කිරීමේ අයිතිය ඇත. එසේම මානව අයිතිවාසිකම් මූලික නිදහස වර්ධනයට, ආරක්‍ෂා කිරීමට සහ ඉටුකර ගැනීමට බාධාවන ඔවුන්ගේ ඇතම් කටයුතු කෙරහි අවධානය යොමුකරවීමට ඊට එරෙහිව විවේචන ඉදිරිපත් කිරීමේ අයිතිය ද ඇත.

9 වන වගන්තිය

1 වන උප වගන්තිය

මේ ප්‍රකාශනයෙහි සඳහන් මානව අයිතිවාසිකම් වර්ධනය කිරීම සහ ආරක්‍ෂා කිරීම ඇතුලත්ව මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ක්‍රියාත්මක කිරීමේදී එම අයිතීන් උල්ලංඝනය වන අවස්ථාවල තනිව හෝ අන් අය සමඟ ඊට අදාල එළදායී පිළියම් ලබා ගැනීමටත් එවැනි උල්ලංඝනයන්ගෙන් ආරක්ෂාවීමටත් සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

2 වන උප වගන්තිය

ඉහත ප්‍රතිඵලය කරා ළඟාවීම සඳහා තම අයිතිවාසිකම් හෝ නිදහස උල්ලංඝනය වී ඇති පුද්ගලයෙකුට පෞද්ගලිකව ම හෝ නීත්‍යානුකූලව බලය දුන් නියෝජිතයෙකු මාර්ගයෙන් ස්වාධීන, අපක්‍ෂපාත සහ

බලයලත් අධිකරණයක් වෙත හෝ නීතිය මඟින් පිහිට වූ වෙනත් අධිකාරයක් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අයිතියක් ඇත. එසේම එම පැමිණිල්ල අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව විමර්ශනය කරවා ගැනීමේ අයිතිය ද ඇත. තව ද ඔහුගේ අයිතිවාසිකම් හෝ නිදහස උල්ලංඝනය වී ඇති බව තීරණය වුවහොත් සුදුසු වන්දියක් ද සහිතව සහන ලබා ගැනීමටත් අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව අවසාන තීන්දුව ක්‍රියාත්මක කරවා ගැනීමටත් අයිතියක් ඇත.

## 3 වන උප වගන්තිය

ඉහත ප්‍රතිඵලය කරා ළඟා වීම සඳහා සෑම පුද්ගලයෙකුටම තනිව හෝ අන් අය ද සමඟ පහත සඳහන් කටයුතු සඳහා අයිතියක් ඇත.

(අ) මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නිලධාරීන්ගේ ක්‍රියාවන්ට සහ රාජ්‍ය ආයතන වල ප්‍රතිපත්තිවලට එරෙහිව රටේ නීති පද්ධතිය මඟින් ඇති කළ බලයලත් දේශීය අධිකරණයකට හෝ පරිපාලන හෝ ව්‍යවස්ථාදායක අධිකාරියකට හෝ වෙනත් ඕනෑම බලයලත් අධිකාරියක් වෙත පෙත්සමක් හෝ වෙනත් සුදුසු ආකාරයකින් පැමිණිලි කිරීමට අයිතිය ඇත.

(ආ) දේශීය නීතියටත් අදාලවන ජාත්‍යන්තර බැඳීම්වලටත් අනුකූල වන ලෙස මතයක් ගොඩනැංවීම සඳහා මහජන අදහස් විමසීම්වලට සහභාගි වීමටත්, පොදු කාර්යයන්ට සහභාගිවීමටත් මෙන්ම නඩු විභාගවලට සහභාගිවීමටත් අයිතියක් ඇත.

(ඇ) මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීම පිණිස වෘත්තීමය සුදුසුකම් ලැබූ නීතිඥ සහය ලබාදීමටත්, වෙනත් අදාල උපදෙස් සහ සහය ලබාදීමටත් මෙන්ම ඊට ඉදිරිපත් වීමටත් අයිතියක් ඇත.

## 4 වන උප වගන්තිය

ඉහත ප්‍රතිඵලය කරා ළඟා වීම සඳහා මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස පිළිබඳව සන්නිවේදනය වන කාරණා සාමාන්‍ය හෝ

විශේෂ ආකාරයෙන් ලබා ගැනීමටත්, ඒවා සලකා බැලීමටත්, එම කරුණුවලට බාධාවකින් තොරව ප්‍රවේශවීමට මෙන්ම ඒ පිළිබඳව ජාත්‍යන්තර ආයතන සමඟ සබඳතාවක් ඇති කර ගැනීමටත් අදාළවන ජාත්‍යන්තර ලේඛණ සහ ක්‍රියාපටිපාටීන් අනුව කටයුතු කිරීමටත් සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

5 වන උප වගන්තිය

තම පාලන බලතලවලට යටත්වන දේශසීමාව තුළ මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස උල්ලංඝනය වී ඇතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති විට රජය විසින් ඒ පිළිබඳ ඉක්මන් සහ අපක්ෂපාත පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

10 වන වගන්තිය

කිසිවෙකු ක්‍රියාවක් කිරීම මඟින් හෝ ක්‍රියාවක් කිරීමට අසමත් වීම මඟින් මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස උල්ලංඝනය කිරීමට හවුල් නොවිය යුතුය. මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස උල්ලංඝනය වන ක්‍රියාවක් කිරීම හෝ යම් නොකර හැරීමක් ප්‍රතික්ෂේප කිරීම නිසා කිසිවකුට දඬුවම් නොකළ යුතුය. ඔහු කිසිදු අගතියකට පත් නොකළ යුතුය.

11 වන වගන්තිය

තනිව හෝ අන් අයද සමඟ තම වෘත්තිය හෝ රැකියාව නීත්‍යානුකූලව කරගෙන යාමට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත. යමෙකුගේ වෘත්තිය නිසා අන් අයගේ මානව ගරුත්වයට, මානව අයිතිවාසිකම්වලට සහ මූලික නිදහසට බලපෑම් ඇතිවේ නම් එම අයිතිවාසිකම් සහ නිදහසට ඔහු විසින් ගරු කරනු ලැබිය යුතුය. එසේම දේශීයව හෝ ජාත්‍යන්තරව පිළිගත් වෘත්තීය ආචාරධර්මවලට ගරු කළ යුතුය.

12 වන වගන්තිය

1 වන උප වගන්තිය

මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස උල්ලංඝනයවීම්වලට එරෙහිව තනිව හෝ අන් අයද සමග සාමකාමීව කරනු ලබන විරෝධතා ක්‍රියාමාර්ගවලට සහායවීමට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

## 2 වන උප වගන්තිය

මේ ප්‍රකාශනය මගින් දක්වා ඇති අයිතිවාසිකම් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යමෙකුට හෝ යම් පිරිසකට එරෙහිව සිදුවන ඕනෑම අයිතිවාසිකම් උල්ලංඝනයක්, තර්ජනයක්, පළි ගැනීමක් ,වෙනස්කොට සැළකීමක්, පීඩනයකට ලක් කිරීමක් හෝ වෙනත් ඕනෑම අත්තනෝමතික ක්‍රියාවන් මගින් ඔවුන්ට හිරිහැර සිදුවන්නේ නම් නිසි බලය ඇති අධිකාරියක් මගින් ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීමට අවශ්‍ය සියලුම පියවර රජය විසින් ගත යුතුය.

## 3 වන උප වගන්තිය

මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස භුක්ති විඳීමට බලපාන රජයේ ක්‍රියාවලට සහ නොකර හැරීම්වලට එරෙහිව තනිව හෝ අන් අයද සමඟ සාමකාමී ආකාරයෙන් විරුද්ධ වීමට හෝ විරුද්ධව කටයුතු කිරීමට අයිතියක් ඇත. එමෙන්ම තනි පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් විසින් කරනු ලබන හිංසාකාරී ක්‍රියාවලට ද එරෙහිව සාමකාමී ආකාරයෙන් විරුද්ධ වීමට හෝ විරුද්ධව කටයුතු කිරීමට අයිතියක් ඇත. එසේ සාමකාමීව විරෝධතා දැක්වීමේදී දේශීය නීතියෙන් ඵලදායී ලෙස ආරක්ෂාවක් ලැබීම සඳහා සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

## 13 වගන්තිය

මෙම ප්‍රකාශනයෙහි 3 වන වගන්තිය අනුව මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස වර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමේ ප්‍රකාශිත කාර්යයට සාමකාමී ආකාරයෙන් තනිව හෝ අන් අය සමඟ සම්පත් අයැද සිටීමට, ලබා ගැනීමට හෝ ඒ සඳහා සම්පත් උපයෝජනය කිරීමට ද සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

14 වන වගන්තිය

1 වන උප වගන්තිය

තම දේශ සීමාව තුළ සිටින ජනතාවගේ සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක, අධිකරණ, පරිපාලනමය හෝ වෙනත් සුදුසු පියවරයන් ගැනීම රජයේ වගකීම වනු ඇත.

2 වන උප වගන්තිය

එවැනි පියවරයන්ට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය.

(අ) දේශිය නීතීන් සහ රෙගුලාසි මෙන්ම අදාළවන මූලික ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ලේඛණ පහසුවෙන් ලබාගත හැකිවන පරිදි ප්‍රකාශයට පත්කිරීම.

(ආ) ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් සම්මුති මඟින් පිහිටුවන ලද ආයතන සංවිධානවලට රජය මඟින් යවන කාලීන වාර්ථා මෙන්ම රැස්වීම්වල සාරාංශ වාර්ථා සහ නිල වාර්ථාද ඇතුළත්ව මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ලේඛණ පහසුවෙන් ලබාගත හැකි වාතාවරණයක් ඇති කිරීම.

3 වන උප වගන්තිය

තම දේශ සීමාව තුළ මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස වර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සුදුසු අවස්ථාවලදී ජාතික මට්ටමින් ආයතන ඇති කිරීම සහ දියුණු කිරීම සඳහා අවශ්‍යය සහය සහ සහතික වීම රජය විසින් දිය යුතුය. එම ආයතන ඔම්බුඩ්ස්මන්වරයා හෝ මානව අයිතිවාසිකම් කොමිෂන් සභා හෝ වෙනත් ඕනෑම ආකාරයක ජාතික මට්ටමේ ආයතන විය හැක.

15 වන වගන්තිය

අධ්‍යාපනයේ සියලුම මට්ටම්වලදී මානව අයිතිවාසිකම් සහ මූලික

නිදහස උගැන්වීම වර්ධනය කිරීම සහ ඊට පහසුකම් සලසාදීම සඳහා රජයට වගකීමක් පැවරී ඇත. නීතිඥයන්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්, හමුදාවට සම්බන්ධ පුද්ගලයන් සහ මහජන නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් වලදී ඊට සුදුසුවන පරිදි මානව අයිතිවාසිකම් වල මූලික කොටස් උගැන්වෙන බවට රජය සහතික විය යුතුය. එය රජයේ වගකීමක් ද විය යුතුය.

## 16 වන වගන්තිය

මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස සම්බන්ධ ප්‍රශ්ණ පිළිබඳව ජනතාව වඩාත් දැනුවත් කිරීම සඳහා දායකවෙමින් වැදගත් කොටසක් ඉටු කිරීම තනි පුද්ගලයන්ට, රාජ්‍ය නොවන සංවිධානවලට සහ අදාළ අනෙකුත් ආයතනවලට පැවරී ඇත. ඒ සඳහා විවිධ ජන කොටස් විවිධ සමාජ පසුබිම් තුළ ඔවුන්ගේ වැඩ කටයුතු කරන බව මෙනෙහි කරමින් අන්‍යෝන්‍ය අවබෝධය, ඉවසීම, ජාතීන් සහ සියලු ජනවර්ග මෙන්ම ආගමික කණ්ඩායම් අතර සාමකාමී සහ මිත්‍රශීලි සබඳතා ඇති කරනු පිණිස අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කළයුතුය.

## 17 වන වගන්තිය

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සදාචාරය, මහජන සාමය සහ පොදු සුභසාධනය පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් සහ නිදහසට ගරු කිරීම පිණිසත්, එම අයිතිවාසිකම් ආරක්ෂාවන බව නිසිලෙස හඳුනා ගැනීම පිණිසත් තනිව හෝ අන් අයද සමඟ මෙම ප්‍රකාශනයේ සඳහන් අයිතිවාසිකම් සහ නිදහස ක්‍රියාත්මක කිරීමට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත. එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ගේ එම අයිතිවාසිකම් ජාත්‍යන්තර බැඳීම් මඟින් සහ නීතිය මඟින් දක්වන ලද සීමාවන්ට යටත් වන්නේය.

## 18 වන වගන්තිය

### 1 වන උප වගන්තිය

නිදහස් සහ පූර්ණ පෞරුෂ සංවර්ධනයක් ඇති කරගැනීම සඳහා

ප්‍රජාව කෙරෙහි සෑම පුද්ගලයෙකුම සතු යුතුකමක් ඇත.

2 වන උප වගන්තිය

ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සහ මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස වර්ධනය කිරීම සඳහාත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ආයතන සහ කාර්යාල වර්ධනය සහ වැඩි දියුණු කිරීම සඳහාත් තනි පුද්ගලයන්, පුද්ගල කණ්ඩායම්, ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවලට වැදගත් කාර්යයභාරයක් පැවරී ඇත.

3 වන උප වගන්තිය

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සහ වෙනත් මානව අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන් මගින් ලබාදුන් අයිතිවාසිකම් සහ නිදහස මුළුමනින්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සමාජයීය මෙන්ම ජාත්‍යන්තර සාමය රැකෙන පරිදි සෑම අයෙකුගේම අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමටත්, සුදුසු පරිදි දායකවීමටත් , තනි පුද්ගලයන්ට, පුද්ගල කණ්ඩායම්වලට, ආයතනවලට සහ රාජ්‍ය නොවන සංවිධානවලට වැදගත් කාර්යයභාරයක් මෙන්ම වගකීමක් පැවරී ඇත.

19 වන වගන්තිය

මෙම ප්‍රකාශනය මගින් දක්වා ඇති අයිතිවාසිකම් සහ නිදහස සිඳ දැමීම අරමුණු කරගත් කිසිඳු ක්‍රියාවක් කළ හැකිවන ලෙස හෝ එවැනි ඕනෑම ක්‍රියාවකට සහභාගීවීමට අයිතියක් ලබාදෙන ආකාරයට කිසිඳු පුද්ගලයෙක් පුද්ගල කණ්ඩායමක් හෝ රජයක් පොළඹවන ආකාරයෙන් මේ ප්‍රකාශනයේ කිසිවක් අර්ථ නිරූපණය නොකළ යුතුය.

20 වන වගන්තිය

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි සඳහන් ප්‍රතිපාදනයන්ට පටහැනිවන ලෙස මෙම ප්‍රකාශනයෙහි සඳහන් කිසිවක් කිරීමට උනන්දු කරවීමට හෝ සහයදීමට තනි පුද්ගලයෙකුට, පුද්ගල කණ්ඩායම්වලට,

ආයතනවලට හෝ රාජ්‍ය නොවන සංවිධානවලට රජයක් විසින් අවසර දියහැකි පරිදි මේ ප්‍රකාශනයෙහි කිසිවක් අර්ථ නිරූපණය නොකළ යුතුය.